**උහන ප්‍රාදේශීය සභාව - 2023**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

උහන ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට උහන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.'

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සූර්යබල විදුලි පහන් 34ක වටිනාකම දෙවරක් ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් වටිනාකම රු.1,587,100ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2021 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා කාලයට අදාළව ලද උසාවි දඩ ආදායම් රු.562,275ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | - එම - | - එම - |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ වටිනාකම රු.2,566,320ක් ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඈ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (PT 1 – 2nd 50%) යටතේ ඉදිකරන ලද වාහන සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා දරන ලද රු.2,398,106ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඉ) | අංක 26/ 106 නිවස අසළ සිට 26 /116 නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සහ ගෙවිය යුතු වටිනාකම කර්මාන්ත ණයගැති හා කර්මාන්ත ණයහිමි යටතේ රු.500,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන අදාළව කර්මාන්ත ණයගැතියන් රු.1,001,348ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | - එම - | - එම - |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැති හා කර්මාන්ත ණයහිමි උපලේඛන සහ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් අතර රු.1,473,330ක නොසැසඳීමක් පැවතුණි. | ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | නොසැසඳීම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) පෙර ගෙවුම් (අත්තිකාරම්) | 1,017,183 | (i) ශේෂ සනාථ කිරීම්<br>(ii) ලේඛන හා උපලේඛන | මෙම අගයන් සනාථ කර ගැනීම සඳහා තොරතුරු සොයා ගැනීමට නොහැකි බව. | ශේෂ නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) සේවක ඇප | 7,590 | (i) සේවක ඇප ලේඛනය<br>(ii) උපලේඛන | - එම - | - එම - |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති සහ රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 1988 ප්‍රදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) 5(12) රීතිය | මුදල් හා ගබඩා කටයුතු පිළිබඳව වගකිව යුතු නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් ඇපකර ලබා ගැනීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | නිලධාරීන්ගෙන් අදාළ චක්‍රලේඛ අනුව ඇපකර ලබා ගැනීමට කටයුතු කරන බව. | මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) 33, 34 සහ 35 රීති | වරිපනම් බදු මුදල් පැහැර හරින්නන් පිළිබඳ ලැයිස්තු පිළියෙල කර දේපල තහනම් කිරීම කෙරෙහි සභාවේ ප්‍රමාණවත් | කාර්තු දැන්වීම් නිකුත් කර හිඟ එකතු කිරීමට කටයුතු කර ඇති අතර ඉදිරියේ දී | - එම - |

| | | | |
|---|---|---|---|
| | අවධානය යොමුව නොතිබුණු අතර හිඟ මුදල් අයකර ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග නොගත හොත් හිඟ ශේෂය තවදුරටත් ඉහළ යා හැකිව පැවතුණි. | දේපල තහනම් කිරීම සඳහා වැඩ කටයුතු සිදු කෙරෙමින් පවතින බව. | |
| (iii) 218 රීතිය | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කරවීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව හඳුනා ගනිමින් වටිනාකම තක්සේරු කර ගැනීමට කටයුතු කරන බව. | - එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,559,586ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.1,834,389ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 3,244,785 | 2,108,779 | 1,901,676 | 4,492,369 | 2,544,784 | 2,420,432 | 2,224,608 | 4,285,266 |
| ii. | කුලී | 13,476,200 | 5,225,212 | 5,056,778 | 332,308 | 12,974,968 | 4,506,650 | 4,615,140 | 163,874 |
| iii. | බලපත්‍ර ගාස්තු | 1,451,000 | 519,500 | 519,500 | - | 1,601,000 | 492,250 | 492,250 | - |
| iv. | වෙනත් ආදායම් | 2,507,000 | 3,586,267 | 3,586,267 | - | 950,000 | 819,770 | 819,770 | - |
| | **එකතුව** | **20,678,985** | **11,439,758** | **11,064,221** | **4,824,677** | **18,070,752** | **8,239,102** | **8,151,768** | **4,449,140** |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වරිපනම් බදු<br>--------------<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු හිඟ වරිපනම් බදු වටිනාකම රු.4,492,369ක් වූ අතර එය වර්ෂයට අදාළ තක්සේරු වටිනාකම වන රු.1,047,926ට සාපේක්ෂව හතර ගුණයකට අධික වටිනාකමක් විය. | කාර්තු දැන්වීම් නිකුත් කර හිඟ එකතු කිරීමට කටයුතු කර ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු කාරණා හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කර නොතිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට අතුරු ව්‍යවස්ථා 05 ක් පමණක් පනවා තිබුණි. | පැනවිය යුතු අතුරු ව්‍යවස්ථා හඳුනාගෙන ඒවා සකස් කර ඉදිරියේ දී අනුමත කර ගැනීමට කටයුතු කරන බව. | අතුරු ව්‍යවස්ථා පනවා කටයුතු නීත්‍යානුකූල කරගත යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව සතුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයක් නොපවතින අතර සමාලෝචිත වර්ෂය තුළ රු.968,397ක වියදමක් දරා රැස්කළ කසල ටොන් 1,200ක පමණ ප්‍රමාණයක් අම්පාර නගර සභාව සතු කසල කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ප්‍රවාහනය කර තිබුණි. මේ අනුව ප්‍රාදේශීය සභාව සඳහා වෙන් වූ කසල කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවීම කෙරෙහි සභාවේ අවධානය යොමුවිය යුතුව පැවතුණි. | ප්‍රාදේශීය ලේකම් මඟින් ඉඩමක් වෙන්කර ගැනීමට කටයුතු කර ඇති අතර ඉදිරියේ දී කසල කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවීමට කටයුතු කරන බව. | කසල කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවීම කෙරෙහි සභාවේ අවධානය යොමුවිය යුතුය. |
| (ආ) | මධ්‍යම පරිසර අධිකාරියේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය ඉදිකිරීමේ කාර්යය සඳහා 2016 වර්ෂයේ ලැබී තිබූ රු.1,789,907කින් සභාව විසින් ගිවිසුම්කරුට රු.1,314,000ක අත්තිකාරම් ලබාදී තිබුණි. | මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සාධාරණීයකරනය කර කොන්ත්‍රාත්කරු වැඩ සම්බන්ධයෙන් මූලිකව | අදාළ ව්‍යාපෘතිය සම්පූර්ණ කරවා ගැනීමට හෝ මුදල් ආපසු ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| මහජනතාවගේ විරෝධය හේතුවෙන් මෙම ඉදිකිරීම් කටයුතු ආරම්භ නොකර අත්හැර තිබූ නමුත් එම අත්තිකාරම් මුදල වර්ෂ 07 කට අධික කාලයක සිට ගිවිසුම්කරුගෙන් ආපසු ලබාගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | කරන ලද වියදම් හැර ඉතිරි අත්තිකාරම් මුදල් සභාව වෙත ලබාදෙන ලෙස දැනුවත් කර ඇති බව. | |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් දේපල මත කාලීනව තක්සේරු කර බදු මුදල් අය කිරීමට කටයුතු නොකර 2007 වර්ෂයේ තක්සේරුව මත පදනම්ව වරිපනම් බදු අයකර තිබුණි. | 2024 වර්ෂය සඳහා 2023 ඔක්තෝබර් මස තක්සේරුව සිදුකර ඇති අතර 2024 වර්ෂයේ අයකරනු ලබන්නේ නව තක්සේරුවට අනුව බව. | වරිපනම් බදු කාලීනව තක්සේරු කර බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් සුසාන භූමි 44 ක හා ක්‍රීඩා පිටි 05 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | මෙම ඉඩම් දැනට සභාව නමට පවරා ගැනීමට කටයුතු කරමින් සිටින අතර ඒවා පවරාගත් පසු තක්සේරු කර ගිණුමට ගැනීමට කටයුතු කරන බව. | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සභාව සතුව පවතින රථවාහන 10 ක් අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ අලුත්වැඩියා කළ නොහැකි වාහන සුදුසු පරිදි අපහරණය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම වාහන වෙන්දේසි කිරීමට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) වෙත දැනුම් දී ඇති බව. | සුදුසු පරිදි අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ඇ) | සභාව භාරයේ පවතින වාහන 14 ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වාහන 02ක අයිතිය මාරු කිරීමට කටයුතු සිදු කරගෙන යනු ලබන අතර ඉතිරි වාහන සඳහා M.T.A.06 පෝරමය සම්පූර්ණ කර ගැනීමට නොහැකි බැවින් පවරා ගැනීමේ කටයුතු නතර වී ඇති බව. | සභාව භාරයේ පවතින වාහනවල අයිතිය සභාව නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවේ තනතුරු 19ක් පුරප්පාඩුව පැවතුණි. | සභාවේ පවතින පුරප්පාඩු සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කර ඇත. දැනට අනියම් සේවක 05 දෙනෙකු වැඩ සඳහා යොදාගෙන ඇති බව. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය සහ මුදල් රෙගුලාසි 133(1) ප්‍රකාරව අභ්‍යන්තර විගණනය මඟින් සභාවේ සියලු කාර්යයන් ආවරණය වන පරිදි ආයතනික මෙහෙයුම් ක්‍රියාවලින් වැඩිදියුණු කිරීම සහ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා වූ ප්‍රමාණවත් නිර්දේශ සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරියේ දී ප්‍රමාණවත් නිර්දේශ සකස් කිරීමට කටයුතු කරන බව. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 4.2 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01–2019 දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ සභාව විසින් විගණන සහ කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | විගණන හා කළමනාකරණ කමිටුව සඳහා ක්‍රියා පටිපාටි ආරම්භ කිරීම සහ රැස්වීම් පැවැත්වීමට පියවර ගත යුතුය. |

### 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත ප්‍රකාරව තිරසාර සංවර්ධන අරමුණු සහ පරමාර්ථ ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය දත්ත රැස්කර එමඟින් අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැලසීමට සභාව විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන පරමාර්ථ හා අරමුණු මුල්කර ගෙන සිව් අවුරුදු සංවර්ධන සැලැස්ම සකස් කරනු ලබන අතර ඒ අනුව හඳුනාගත් ව්‍යාපෘති සභා අරමුදලින් හා වෙනත් සංවර්ධන ව්‍යාපෘතිවලින් ක්‍රියාවට නන්වන බව. | චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන පරමාර්ථ සහ අරමුණු ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |